ඇමුණුම 3

## මාර්ගෝපදේශ සටහන: වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම

අරමුණු:

• ඉලක්කය, කාලසීමාව, ප්‍රතිලාභ සහ වැඩසටහනට සහභාගිවන්නන්ගේ අපේක්ෂාවන් ඇතුළු සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු බෙදා ගැනීම.

• රැස්වීම අවසානයේ දී සුදුසුකම් ලත් සහභාගිවන්නන් සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම මඟින් නිල වශයෙන් ලියාපදිංචි කිරීම.

අවශ්‍ය ද්‍රව්‍ය:

• වැඩසටහන් අත් පත්‍රිකාව
• වැඩසටහන් අවබෝධතා ගිවිසුමෙහි පිටපත් වැඩි ගණනක්

කාලය:පැය 1 සිට 2 දක්වා

සහභාගිවන්නන්:

- සමෘද්ධි සංවර්ධන නිලධාරි (ස.සං.නි) [පහසුකම් සපයන්නෙකු ලෙස]
- ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරු [ පහසුකම් සපයන්නෙකු ලෙස]
- <u>ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පත් කරන ලද වෙනත් ඕනෑම රාජ්‍ය නිලධාරියෙක්</u>
- සුදුසුකම්ලත් සහභාගිවන්නන් ලෙස වැඩසටහනට තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභීන්
- සුදුසුකම්ලත් සහභාගි වන්නන්ගේ නිවසේ සාමාජිකයන්
    - (වයස අවුරුදු 18 ඉක්මවූ)වැඩිහිටියෙකු විය යුතුය.
    - තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභියෙකු ලෙස තෝරා ගනු ලැබූ තැනැත්තෙකු විය යුතුය.
    - සුදුසුකම්ලත් නිවසේ ප්‍රතිලාභියාගේ පවුලේ වෙනත් සාමාජිකයෙකු මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම පිණිස අවශ්‍ය කරන සහයෝගය ලබා දීමට තරම් ධාරිතාවයක් ඇති තැනැත්තෙකු විය යුතුය.
    - තම සහකරු/සහකාරිය වැඩසටහනට සහභාගී වීමට කැමැත්තෙන් පසුවන බවට සහ හැකියාව ඇති බවට උපකල්පනය කරමින්,විවාහ වී සිටින අස්වැසුම ප්‍රතිලාභීන්ට ඔහුගේ /ඇයගේ කැමැත්ත අනුව තම සහකරු/සහකාරියට (ස්වාමිපුරුෂයා/භාර්යාව) ආරාධනා කළ හැකිය.
    - අවිවාහක අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා, ඔහු/ඇය වැදගත් තීරණයක් ගැනීමට පෙර සාමාන්‍යයෙන් උපදෙස් ලබා ගන්නා නිවසේ/පවුලේ වෙනත් වැඩිහිටි සාමාජිකයෙකු තෝරා ගැනීමට නිර්දේශ කෙරේ.

**සටහන :**

තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභියාට තම නිවසේ සාමාජිකයෙකු තෝරා ගැනීමේ අපහසුතාවයක් පවතින්නේ නම්, නිවසේ සිටින සාමාජිකයන් සහයෝගය ලබා නොදෙන්නේ නම් සහහෝ නිවසේ/ සිටින සාමාජිකයාට පැමිණීමට නොහැකිනම්, සුදුසුකම්ලත් සහභාගිවන්නා ඒ බව සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා වෙත දැනුම් දිය යුතු අතර, ඒ අනුව නිවසේ ජීවත් වන වෙනත් වැඩිහිටියෙකුට හෝ ඥාතියෙකුට ආරාධනා කළ යුතුය .උදා) දෙමාපියන් හෝ සහෝදර සහෝදරියන් වෙනත් නිවසක ජීවත් විය හැකි නමුත් ප්‍රතිලාභියාට උපදෙස් සහ දිරිගැන්වීම් ලබා දිය හැකි පාර්ශ්වයන් ලෙස හඳුනා ගනී .( නිවසේ හෝ පවුලේ වෙනත් වැඩිහිටියෙකු නොමැති නම්, ප්‍රතිලාභියා විසින් ඒ බව සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා වෙත දැනුම් දිය යුතු අතර එවන් අවස්ථාවක පමණක් නිවසේ සාමාජිකයෙකු නොමැතිව පැමිණිය හැකිය.

සූදානම් වීම:

• **දිනය සහ වේලාව තීරණය කිරීම:** කළමනාකරු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් සුදුසුකම්ලත් වැඩසටහන් සහභාගිවන්නන් සහ සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ නිවෙස්වල සාමාජිකයින්වැඩි පිරිසකට සහභාගී විය හැකි දිනයක් සහ වෙලාවක් වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම පවත්වන දිනය සහ වේලාව ලෙස හඳුනාගත යුතුය.

• **ස්ථානය වෙන් කර ගැනීම:** වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම පවත්වන වන ස්ථානය සියලුම ආරාධිතයින්ට, සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ නිවසේ සාමාජිකයන්ට සහ රැස්වීමට සහභාගි වීමට ආරාධනා කර ඇති ඕනෑම ප්‍රජා සාමාජිකයෙකුට රැඳී සිටීමට තරම් විශාල විය යුතුය.සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින්, තම කළමනාකරු සමඟ සාකච්ඡා කර වඩාත් සුදුසු ස්ථානය හඳුනා ගැනීමට සහ එය කල්තියා වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය.

> සටහන: විශාල සහභාගි වන්නන් පිරිසකට පහසුකම් සැපයීමට අවශ්‍ය ඉඩකඩ සහිත ස්ථානයක් නොමැති නම්, රැස්වීම් දෙකක් සංවිධානය කිරීමට සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින්කටයුතුකළයුතුය. මෙහි දී අපේක්ෂිත සහභාගිවන්නන්ගෙන් අඩක් එක් රැස්වීමකට සහ ඉතිරි සහභාගිවන්නන් ප්‍රමාණය දෙවන රැස්වීමට වශයෙන් ආරාධනා කළහැකිය. මෙය එකම දිනයේ විවිධ වේලාවන් දෙකකදී හෝ දින දෙකකඑකම වේලාවක දී පැවැත්වීමට කටයුතු කළ හැකිය.

• **අනිවාර්ය රැස්වීම:** වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම සුදුසුකම්ලත් සහභාගිවන්නන් සඳහා අනිවාර්ය රැස්වීමක් බව සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා විසින් පැහැදිලිව සන්නිවේදනය කළ යුතුය. සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමෙන් තොරව ඔවුන් මෙම රැස්වීමට සහභාගී වීමට අපොහොසත් වුවහොත්, ඔවුන් සවිබල ගැන්වීමේ වැඩසටහනට ඇතුළත් වීමට සුදුසුකම් නොලබන අතර, නව ජීවනෝපාය මාර්ගයක් ආරම්භ කිරීමට හෝ පවතින ජීවනෝපාය මාර්ගය වැඩි දියුණු කර ගැනීමට ලබා දෙන විවිධ ආකාරයේ පුහුණුවීම් සහ ජීවනෝපාය ආධාර ප්‍රදානයන් ඇතුළුව වැඩසටහන මඟින් ලබා දෙන ප්‍රතිලාභ කිහිපයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වනු ඇත.

- **පූර්ව දැනුම්දීම:**
  - සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා විසින් තෝරාගත් සෑම අස්වැසුම ප්‍රතිලාභියෙකුටම වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම පිළිබඳව අවම වශයෙන් සතියකට පෙර දුරකථන ඇමතුමකින් හෝ ඔවුන්ව පෞද්ගලිකව මුහුණට මුහුණ හමුවීම මඟින් දැනුම් දිය යුතුය. දැනුම්දීමේ නිවේදනයේ පහත තොරතුරු අන්තර්ගතවිය යුතුය:
    - රැස්වීම පවත්වන ස්ථානය
    - රැස්වීම ආරම්භ කරන වේලාව
    - මෙම රැස්වීමේ අරමුණ සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳ වැදගත් තොරතුරු හුවමාරු කර ගැනීම සහ ඔවුන් නිල වශයෙන් වැඩසටහනට ඇතුළත් කර ගැනීම බව සිහිපත් කරන්න.
    - සවිබල ගැන්වීමේ වැඩසටහනට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීමට මෙය අනිවාර්ය රැස්වීමක් බව සිහි කැඳවීමට කටයුතු කරන්න.
    - තම නිවසේ සාමාජිකයා රැගෙන ඒමට සහභාගිවන්නන් දිරිමත් කරන්න.
  - සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා විසින් තෝරාගත් සෑම අස්වැසුම ප්‍රතිලාභියෙකුගෙන්ම ඔවුන් වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීමට රැගෙන එන පවුලේ සාමාජිකයාගේ නම සහ තමාට ඇති සම්බන්ධය විමසිය යුතුය. මෙහි අරමුණ වනුයේ තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභියා විසින් නිවසේ සාමාජිකයෙකුට ආරාධනය කර ඇති බව තහවුරු කර ගැනීමයි.

- සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා විසින් තෝරාගත් සෑම අස්වැසුම ප්‍රතිලාභියෙකුටම වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම, පැවැත්වෙන ස්ථානය සහ වෙලාව පිළිබඳ රැස්වීම පැවැත්වෙන දින උදෑසන දී සිහි කැඳවිය යුතුය.

රැස්වීම අතරතුර කළ යුතු දේ:

1. සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා සහ ප්‍රාදේශීය කළමනාකරු හඳුන්වා දීසවිබල ගැන්වීමේ වැඩසටහන තුළ ඔවුන්ගේ එක් එක් භූමිකාවන්පැහැදිලි කිරීම.

2. වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීමේ අරමුණු පැහැදිලි කිරීම:

• සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු බෙදා ගැනීම: ඉලක්කය, කාලසීමාව, ප්‍රතිලාභ සහ වැඩසටහනට සහභාගිවන්නන්ගේ අපේක්ෂාවන් ආදිය.

• රැස්වීම අවසානයේ දීසුදුසුකම්ලත් සහභාගිවන්නන් අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමෙන් නිල වශයෙන් ලියාපදිංචි කිරීම.

**3. සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු බෙදා ගැනීමේදී පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න:**

• කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

• තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභීන්ගේ සමාජ ආර්ථික සවිබල ගැන්වීම සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම වැඩසටහනේ ඉලක්කය වේ.

• වැඩසටහන මාස 24ක් පුරා ක්‍රියාත්මක කෙරේ. 24 වන මාසයට පසු, සියලු කටයුතු අවසන් වනු ඇත.

• වැඩසටහනේ වත්මන් අදියරේදී දිවයින පුරා වැඩසටහනට සහභාගී වීමට තෝරාගෙන ඇත්තේ අස්වැසුම ප්‍රතිලාභීන් 12,800ක් පමණි.

**4. මෙම වැඩසටහනට සහභාගී වීමේ ප්‍රතිලාභපිළිබඳ දැනුවත් කරන්න:**

• නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාරය වැඩිදියුණුකිරීමට (ක්ෂුද්‍ර ව්‍යවසාය මාර්ගය යටතේ) ජීවනෝපාය ආධාර ප්‍රදානයක් හෝ වෘත්තීය/නිපුණතා පුහුණුවක් ලබා ගැනීමට සහ රැකියාවක නිරත වීමට (රැකියා මාර්ගය යටතේ) ප්‍රදානයක් හිමි වීම.

• එම ප්‍රදේශයේ ඉල්ලුමක් සහිත, ක්‍රියාත්මක කළ හැකි, ලාභදායී සහ සහභාගිවන්නන්ට සුදුසු ජීවනෝපායක් (ක්ෂුද්‍ර ව්‍යවසායමාර්ගයක් හෝ රැකියා මාර්ගයක්) තෝරා ගැනීමට වැඩසටහනෙන් සහායහිමිවීම.

• තෝරාගත් ජීවනෝපාය පිළිබඳ ව්‍යාපාර කුසලතා පුහුණුවක් සහ තාක්ෂණික පුහුණුවක්(ක්ෂුද්‍ර ව්‍යවසාය මාර්ගය යටතේ)ලබා දීම.

• (රැකියා මාර්ගය යටතේ)වෘත්තීය/නිපුණතා පුහුණුව ලබා දීම සහ රැකියා අවස්ථා සමඟ සම්බන්ධ කිරීම.

• මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණුව.

• නිතිපතා ඉතිරි කිරීමට සහ සමූහයෙන් ණය ලබා ගැනීමට උපකාර කෙරෙන ග්‍රාමීය ඉතුරුම් සහ ණය සමිතිය (ග්‍රා.ඉ.ණ.ස)ට සහභාගීවියහැකි වීම.

• මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය යහපැවැත්ම පිළිබඳ හඳුන්වාදීම.

• ආපදා සඳහා සූදානම් වීම, බෝවන සහ බෝ නොවන රෝග, ධනාත්මක මවුපියන් ලෙස කටයුතු කිරීම, යනාදී වැදගත් සමාජීය සහ සෞඛ්‍ය ගැටළු පිළිබඳව ජීවන කුසලතා පුහුණුවක් ලබා දීම.

• මූලික සේවා සහ සම්පත්, මූල්‍ය සේවා, වෙළඳපල ක්‍රියාකාරීන් සහ ප්‍රජා ජාලය මඟින් සම්බන්ධ කිරීම.

• පුහුණු සැසි - මසකට දෙවතාවක් සිදු කෙරේ - සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා විසින් සහභාගිවන්නා වෙත පැමිණෙන අතර,

i) සහභාගිවන්නාගේ සහ ඔහුගේ/ඇයගේ පවුලේ සමස්ථ යහපැවැත්ම නිරීක්ෂණය කර ඔවුන්ට පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා මාර්ගෝපදේශ සැපයීම සහ,

ii) ජීවනෝපාය ආධාර දීමනාව යටතේ සහාය දක්වමින් සිටින ජීවනෝපාය අධීක්ෂණය කිරීම.

**5. මෙම වැඩසටහනට සහභාගිවන්නන් වෙතින් අපේක්ෂා කරන දෑ පිළිබඳ දැනුවත් කරන්න:**

• වැඩසටහනේ ක්‍රියාකාරී සහභාගිවන්නෙකු බවට පත්වූ පසු ඒ සඳහා කැපවී ක්‍රියාකිරීම, සහවැඩසටහන නිල වශයෙන් අවසන් වන තෙක්, පුහුණුවීම්, පුහුණු කිරීම් සහ උපදේශන සැසි, ජීවනෝපාය ක්‍රියාකාරකම් සහ රැස්වීම් වැනි සියලුම ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම.

• වැඩසටහන් ක්‍රියාකාරකම්, පුහුණු සැසි සහ අධීක්ෂණ චාරිකා අතරතුර සියලුම වැඩසටහන් නිළධාරීන් සමඟ පූර්ණ සහ අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඉල්ලා සිටින අවස්ථාවන්හි දී සත්‍ය තොරතුරු බෙදා ගැනීම.

• වැඩසටහන මගින් සහය දක්වන ජීවනෝපාය ක්‍රියාවට නංවන අතරතුර මුහුණ දෙන අභියෝග හෝ ගෘහාශ්‍රිතව මුහුණ දෙන අභියෝග ඇතුළුව නිවැරදි සහ සත්‍ය තොරතුරු අධීක්ෂණය සඳහා පැමිණෙන නිලධාරීන් වෙත සැපයීම.

• වැඩසටහන මගින් හඳුන්වා දුන් ග්‍රාමීය ඉතුරුම් සහ ණය සමිතිය (ග්‍රා.ඉ.ණ.ස) සාමාජිකයෙකු වීම සහ සාමාජිකයින් විසින් සකසා ඇති ග්‍රා.ඉ.ණ.ස ව්‍යවස්ථාවට අනුකූලව, වැඩසටහන නිල වශයෙන් අවසන් වන තෙක් එහි සියලුම රැස්වීම්වලට නිතිපතා සහ අඛණ්ඩව සහභාගී වීම.

• ග්‍රා.ඉ.ණ.ස පිළිබඳ පුහුණුව, මූල්‍ය සාක්ෂරතා පුහුණුව, ජීවන කුසලතා පුහුණුව, ව්‍යාපාර කුසලතා පුහුණුව සහ තාක්ෂණික පුහුණුව (ව්‍යවසායකත්ව) සහ නිපුණතා පුහුණුව (රැකියා මාර්ග) ඇතුළුව මෙම වැඩසටහන මඟින් සපයනු ලබන සියලුම පුහුණුවීම් වෙත පැමිණීම සහ ඒ සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

• විවිධ පුහුණුවීම්, පුහුණු සැසි සහ වැඩසටහන් ක්‍රියාකාරකම් වලදී ලබා දෙන දැනුම, කුසලතා සහ මඟපෙන්වීම පවුලේ සාමාජිකයන් සමඟ බෙදාහදා ගනිමින් එය එදිනෙදා ජීවිතයට ඇතුළත් කිරීම.

• මෙම ප්‍රතිලාභී නිවස සඳහා සුදුසු ජීවනෝපායක් හඳුනා ගැනීම පිණිස ජීවනෝපාය ගැලපීමේ උපදේශන ක්‍රියාවලියේ සක්‍රීයව නිරත වීම.

• ජීවනෝපායක් ආරම්භ කිරීමට හෝ දැනට පවතින ජීවනෝපාය වැඩිදියුණු කිරීමට අවශ්‍ය අයිතම, පිරිවැය ඇස්තමේන්තු සහ මිල ගණන් ඇතුළුව, නිවැරදි තොරතුරු සහිත ජීවනෝපාය සැලැස්මක් සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයාගේ මඟපෙන්වීම සහිතව සකස් කිරීම.

• වැඩසටහන යටතේ වඩාත් ගැළපෙන බවට හඳුනාගත් ජීවනෝපාය ක්‍රියාත්මක කිරීමට, පවත්වා ගෙන යාමට සහ වැඩිදියුණු කිරීම පිණිස සුදුසුම දේ කළ යුතු අතර එවිට එතුළින් ස්ථාවර සහ විශ්වාසනීය ආදායමක් උපයා ගැනීමට හැකි වනු ඇත.

• ජීවනෝපාය සැලැස්මේ විස්තර කර අනුමත කර ඇති පරිදි, එම අරමුණ සඳහා පමණක් ජීවනෝපාය ආධාර දීමනාව භාවිතා කිරීම.

• ජීවනෝපාය ආධාර ප්‍රදානය කිසිම හේතුවක් මත සහ වෙනත් කිසිම කටයුත්තක් සඳහා අවභාවිතා නොකිරීම.

• ජීවනෝපාය සැලැස්ම ක්‍රියාවට නැංවීම පිණිස අනුමත ජීවනෝපාය ආධාර ප්‍රදානයට වඩා වැඩි මුදලක් අවශ්‍ය වන්නේ නම්, තෝරාගත් ජීවනෝපාය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමතර මුදලතමා විසින් දායක කිරීම.

• ජීවනෝපාය ආධාර ප්‍රදානය භාවිතා කර මිලදී ගන්නා ඕනෑම භාණ්ඩයක්, තෝරාගත් ජීවනෝපාය සඳහා පමණක් භාවිතා කිරීම, එය නිසි ලෙස නඩත්තු කිරීම, අනිසි ලෙස භාවිතා නොකිරීම හෝ නීති විරෝධී ක්‍රියාවක නොයෙදවීම.

• ජීවනෝපාය ආධාර ප්‍රදානය උපයෝගී කර ගනිමින් වැඩසටහන මඟින් සපයනු ලබන කිසියම් ද්‍රව්‍යයකට/වත්කමකට (උදා: අමුද්‍රව්‍ය, යෙදවුම්, උපකරණ, මෙවලම් ආදිය) සොරකම් කිරීම, අලාභ හෝ හානි සිදුකිරීම වැනි යමක් සිදුවුවහොත්, ඒ බව ප්‍රාදේශීය කළමනාකරු වෙත වාර්තා කිරීම උදෙසා සමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත වාර්තා කිරීම.

• මෙම වැඩසටහන යටතේ, හිමිවන සියලු උපකාර,ගෘහස්ථ ආර්ථික හා සමාජීය වැඩිදියුණුව පිණිස ඉතිරි කිරීම් වැඩි කිරීමට සහ ජීවනෝපාය සඳහා නැවත ආයෝජනය කිරීමට ප්‍රවේශමෙන් හා උනන්දුවෙන් යෙදවීම.

6. සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳව සහභාගීවන්නන්ට කිසියම් ප්‍රශ්නයක් ඇත්දැයි විමසා ඒවාට පිළිතුරු දෙන්න. අදාළ ප්‍රශ්නයට සමෘද්ධිසංවර්ධන නිලධාරීවරයාට හෝ ප්‍රාදේශීය කළමණාකරුට එම අවස්ථාවේ දී පිළිතුරු දීමට නොහැකි වන්නේ නම්, ප්‍රශ්නය සටහන් කර, ඉල්ලා සිටින තොරතුරු සමඟ නැවත පිළිතුරු ලබා දෙන බවට සහතික වන්න.

7. අවබෝධතා ගිවිසුම හඳුන්වා දීමට කටයුතු කර කැපවීමෙන් යුක්තව වැඩසටහනට සහභාගී වීමට සූදානම් තැනැත්තන් සඳහා අවබෝධතා ගිවිසුමේ පිටපතක් ලබා දී, ඔවුන්ගේ අත්සන ඉල්ලා සිටින්න.

8. තෝරාගත් කිසියම් නිවසක් සවිබල ගැන්වීමේ වැඩසටහන කෙරෙහි උනන්දුවක් නොදක්වන්නේ නම් සහ කිසියම් හේතුවක් නිසා එයට සහභාගී නොවීමට තීරණය කරන්නේ නම්, ඒ සඳහා හේතු දක්වන ලෙස ඔවුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින්න. එම හේතු ප්‍රාදේශීය කළමණාකරු හරහා දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීමට කටයුතු කරන්න.

9. රැස්වීමට සහභාගි වූ සැමට ස්තුතිකර වැඩසටහන පිළිබඳ අමතර ප්‍රශ්න හෝ අවධාරණයන් පවතින්නේ නම් සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා හෝ ප්‍රාදේශීය කළමණාකරු සමඟ සෘජුව සාකච්ඡා කිරීමට දිරිමත් කරන්න.

සටහන: අසනීප තත්ත්වයන්, නොවැළැක්විය හැකි සත්කාර වගකීම්, පෙර යොදාගෙන තිබූ ගමන් හෝ රැකියාවේ වගකීම් වැනි වලංගු හේතුවක් නිසා තෝරාගත් අස්වැසුම ප්‍රතිලාභියෙකුට වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීමට සහභාගී වීමට නොහැකි නම්, සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයාවිසින්සැලසුම්ගත රැස්වීමක් සංවිධානය කර එක් එක් ප්‍රතිලාභියා සමඟ වෙන වෙනම හමුවිය යුතුය. වලංගු හේතූන් සහිත ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු සිටී නම්, සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා විසින් වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම පැවැත්වීමට වඩාත් සුදුසු දිනයක් සොයා ගැනීමට හෝ ඔවුන්ට සහභාගී විය හැකි දෙවන රැස්වීමක් සංවිධානය කිරීමට සලකා බැලිය යුතුය. වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම හෝ සැලසුම්ගත රැස්වීම යන අවස්ථා දෙකම මඟ හරින ඕනෑම අයෙකු වැඩසටහනට සහභාගී වීමට නුසුදුසු වනු ඇත.